# දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
## විභාග අපේක්ෂකයන්ට උපදෙස්

ප්‍රවේශ පත්‍රය සහ ශිෂ්‍ය වාර්තා පොත, අනන්‍යතා පත්‍රය හෝ හැඳින්වීමේ පත්‍රය නොමැතිව කිසිම අපකේෂකයකු විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් අත්සන පැහැදිලි ලෙස තීන්තෙන් ලිවිය යුතුය. එසේ නොකරන අපේක්ෂකයන් නුසුදුස්සන් කරනු ඇත.

01.

(i) විභාග ශාලාව තිබෙන ස්ථානය නිසිසේ නොදන්නේ නම්, විභාගය ඇරඹීමට කලින් දිනක ඒ පිළිබඳ විමසිලිමත්ව විභාගය ආරම්භ කිරීමට මිනිත්තු 30කට ප්‍රථම විභාගය පැවැත්වෙන ස්ථානයට පැමිණිය යුතු ය. අදාළ නිරීක්ෂකවරුන් විසින් විභාග ශාලාවට ඇතුළුවීම සඳහා කැඳවනතුරු විභාග ශාලාවට ඇතුළු නොවිය යුතුය.

(ii) විභාග අපේක්ෂකයින් තමන්ගේ අංකය දරණ අසුන්හි මිස, අන් අසුනක ඉඳ ගැනීම නොකළ යුතු අතර ශාලාධිපතිගේ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතු ය.

(iii) වෛද්‍ය හේතු නිසා මුළු විභාගයට ම හෝ විභාගයෙන් කොටසකට හෝ පෙනී සිටීමට නොහැකි වන අපේක්ෂකයින් වහාම ඒ බව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත විදුලි පුවතකින් දැනුම් දිය යුතුය. එබඳු අපේක්ෂකයන් සම්බන්ධව ක්‍රියාකල යුතු ආකාරය මෙම උපදෙස් පත්‍රිකාව අවසානයට දක්වා ඇත.

02. යම්කිසි විෂයයක් පිළිබඳ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීම ගැන තමාට සැකයක් ඇති වූ විට එම පිළිතුරු ලිවීම ගැන තමාට සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම පටන් ගැනීමට පෙර ශාලාධිපතීන්ට ඒබව දන්වා එය නිරාකරණය කර ගත යුතුය. එලෙස ක්‍රියා නොකිරීමෙන් අපේක්ෂකයකුට යම් පාඩුවක් සිදුවුවහොත්, ඒ පිළිබඳව හානි පූර්ණයක් පසුව කිරීමට නොහැකි බව මතක තබා ගත යුතුය.

03. පිළිතුරු ලිවීම පිළිබඳ ව ප්‍රශ්න පත්‍රයේ සඳහන් කොට ඇති උපදෙස් ඉතා සැලකිල්ලෙන් කියවා තේරුම් ගත යුතුය.

04. විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යයතා පත්‍රය (හැඳුණුම්පත) ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීමට අවස්ථාව නොලැබී යා හැකිය. අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බව කල්තියා විභාග ශාලාධිපතීන් හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට අවසර ලබා ගත යුතුය.

05. විභාග අපේක්ෂකයන් තම ප්‍රයෝජනය සඳහා පෑන්/ පැන්සල්/ මකන/ අඩිකෝදු/ ජ්‍යාමිතික උපකරණ/ පාට පැන්සල් යනාදී වශයෙන් අවශ්‍ය උපකරණ රැගෙන ආ යුතුය. මීට අමතරව, විභාගයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනයට ගත හැකි කිසිම ලියවිල්ලක් හෝ සටහනක් හෝ උපකරණයක් තමා විසින් හෝ තමා වෙනුවෙන් අන් අයකු විසින් හෝ ශාලාව තුළට නොගෙනෙන බවට වග බලා ගත යුතුය.

06. පිළිතුරු ලිවීම ආරම්භ වීමට පෙර, තමාට අයත් සංකේත සහිත විභාගය හා විෂය/ විෂය කොටසෙහි නමත් පැහැදිලි සේ පිළිතුරු පතේ නියම තැන ලිවිය යුතුය.

07. ප්‍රශ්නයක කොටසකට පිළිතරු ලිවීමෙන් පසු ඉතිරි කොටසට පිළිතුරු ලිවීමට පෙර, පේළි කීපයක් හිස් කර තැබීමටද, සම්පූර්ණ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමෙන් පසු ද පේළි කීපයක් හිස් කර තැබීමද ඔබේ ම සුභ සිද්ධිය සඳහා වනු ඇත. විභාග ශාලාධිපතීන් දැන්වුවහොත් හෝ ප්‍රශ්න පත්‍රයේ දක්වා තිබුණහොත් ඒ ඒ කොටස් වලට පිළිතුරු ලියන පොත් වෙන් වෙන් වශයෙන් ප්‍රයෝජනයට ගත යුතුය.

08. පිළිතුරු ලියන කඩදාසියෙහි දෙපැත්තෙන් වෙන් කරන ලද තීරුවල කිසිවක් නොලිවිය යුතුය. වම් පැත්තේ තීරයෙහි ප්‍රශ්නවල අංකය වරදවා හෝ නොපැහැදිලිව යෙදීම ගැටළුවලට හේතු වනු පමණක් නොව අපේක්ෂකයාට ලකුණු අඩුවීමට ද හේතු විය හැකි බැවින්, ප්‍රශ්නවල අංක නිසිආකාරව යෙදීමට සිහි තබා ගත යුතුය.

09. ගණිත ප්‍රශ්නවලට පිළිතුරු සපයන විට දළ සටහන්, කටුවැඩ යනාදිය ඒ ඒ පිළිතුරෙහි කොටස් වශයෙන් පිළිවෙළින් දැක්විය යුතුය. අවශ්‍ය තැන්වලට අඳිනු ලැබූ රූප සටහන්, චිත්‍ර ආදිය පැහැදිලිව ද නිවැරදිව ද සෑහෙන පමණ විශාලව තිබිය යුතුය.

10. ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියා අවසන් වූ විට පිළිතුරු ලියූ කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට පිළිතුරු ලියූ පිළිවෙල අනුවඑකතු කොට එහි වම් පැත්තේ උඩ කෙළවර හිල් කොට නූලකින් බැඳ තැබිය යුතුය. දකුණු පැත්ත උඩ කෙළවර නිදහස්ව තැබිය යුතුය.

11. ඔබේ පිළිතුරුපත විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහාය පරීක්ෂකයෙකුට හෝ සියතින් භාර දිය යුතු ය. නොහොත් පිළිතුරුපත් එකතු කරන තෙක් සිය අසුනේම හිඳගෙන සිටිය යුතු ය. එසේ නොකිරීම පිළිතුරුපත් නැති වී යාමටද, ඔබ

ඇතැම් ප්‍රශ්න පත්‍රයන්ට පිළිතුරු නොලිවෙකු සේ සැලකීමට ද හේතු විය හැකිය. කවර කරුණක් නිසාවෙන් ඔබගේ පිළිතුරු පත විභාග ශාලාවෙහි සේවකයකුට භාර නොදිය යුතුය.

12. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ සහාය පරීක්ෂකයකු හට කථා කිරීමට අවශ්‍ය වූ විටද සිය අසුනින් නොනැගිට අත පමණක් ඔසවා සංඥා කිරීම හෝ මේසය මතට සෙමෙන් තට්ටු කිරීමක් හෝ කළ යුතු ය. විභාග ශාලාව තුළ සිටින කිසිවෙකුට බාධාවක් වන අයුරින් කටයුතු නොකිරීමට වග බලා ගත යුතුය.

13. ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර දී ඇති ප්‍රශ්න පත්‍ර සඳහා පමණක් භාවිතා කිරීමට ඔබ විසින් ගණක යන්ත්‍ර රැගෙන ආ යුතුය.

14. විභාග ශාලාව තුළට ජංගම දුරකථන රැගෙන නො ආ යුතුය.

## විභාග අපේක්ෂකයන් සඳහා නියෝග

විභාග අපේක්ෂකයන් මතු දැක්වෙන නියෝග පිළිපැදීමට බැඳී සිටිය යුතුය. ඊට අමතරව පහත දැක්වෙන කරුණු ගැන දැඩි අවධානය යොමු කල යුතුයි.

I.

(අ) සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළ විභාග ශාලාධිපතින්ට ද සහාය පරීක්ෂකයන්ට ද, අනෙකුත් අපේක්ෂකයන්ටද බාධා හෝ හිරිහැර නොවන සේ හැසිරිය යුතුය. විභාග ශාලාව තුළ හා අවට නිශ්ශබ්ද ව සිටිය යුතු ය.

(ආ) ඇඳුම් මත, ශරීරය මත හෝ අත්ල මත, විභාග ප්‍රවේශ පත්‍රය, කාල සටහන්, වාර්ථා පොත හෝ වෙනත් ඕනෑම දෙයක් මත සටහන්, සංඥා හා සූත්‍ර වෙනත් අනවසර ද්‍රව්‍ය වල සටහන් කර ලග තබා ගැනීම නොකල යුතුය.

(ඇ) තමන්ට සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර අන් පොත්පත් ලුහුඬු සටහන්, අත්බෑග්, පෙට්ටි, පුවත්පත් යනාදිය තමා ළඟ තබා නොගත යුතු ය. විභාග ශාලාවේදී ලියන ලද කිසිදු දෙයක් හෝ පිළිතුරු ලිවීම පිණිස තමන්ට දෙනු ලබන කඩදාසි හෝ තමන්ට අයත් නොවන අනෙක් ද්‍රව්‍ය හෝ විභාග ශාලාවෙන් පිටතට ගෙන නොයා යුතුය.

(ඈ) කඩදාසි, සටහන්, ජංගම දුරකථන, ඉලෙක්ට්‍රොනික් උපාංග හා ඊට සමාන ද්‍රව්‍ය හෝ වෙනත් අපේක්ෂකයෙකුගේ පිටපත් වලින් පිටපත් නොකල යුතුය.

II. මෙම නියෝග උල්ලංඝණය කරන අපේක්ෂකයකුහට සනාත සභාව අනුමත කරන පරිදි මතු දැක්වෙන දඩුවම් එකක් හෝ වැඩි ගණනක් හෝ පනවනු ලැබේ.

(අ) පවත්වන ලද සමස්ත පරීක්ෂණයේ ම හෝ ඉන් කොටසකට හෝ එක් විෂයයකට පෙනී සිටීම තහනම් කිරීම.

(ආ) එක් අවුරුද්දකට, අවුරුදු කීපයකට හෝ මුළු ජීවිත කාලයටම දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් පවත්වන කිසිදු විභාගයකට පෙනී සිටීමට අවසර නොදීම.

(ඇ) පන්ති සමාර්ථයක් වෙතොත් ඒ සඳහා හිමිකම අහිමි කිරීම.

(ඈ) ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සහභාගී වීමට අවසර නොදීම.

**වෛද්‍ය හේතුන් සම්බන්ධව ක්‍රියා කල යුතු ආකාරය**

i. විභාගය සඳහා ඉදිරිපත් නොවී වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී අදාල විෂය පත්‍රය අවසන් වී දින 14ක් ගත වීමට ප්‍රථම, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මඟින් නිකුත් කරනු ලබන අදාළ අයදුම්පත්‍රය සම්පූර්ණ කර වෛද්‍ය සහතිකය, ප්‍රවේශ පත්‍රයද (විෂයන් සියල්ලටම පෙනී සිට අවසන් නම් පමණක්) සමඟ ඉදිරිපත් කළ යුතුය. වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය අමතා ලබා ගන්නා ලෙස දන්වා සිටී.

ii. ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික රජයේ/ ආයුර්වේද ආරෝග්‍ය ශාලාවකින් හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික විය යුතුය.

iii. ඉහත සියළු වෛද්‍ය සහතික රජයේ ආකෘති පත්‍රයක/ ලිපි ශිර්ෂ සහිතව හා නිල මුද්‍රාවක් සහිතව නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකයක් විය යුතුය.

iv. ඉදිරිපත් කරනු ලබන එක් වෛද්‍ය සහතිකයක් උපරිම දින 14 දක්වා පමණක් ඉදිරිපත් කළ යුතු අතර, වෛද්‍ය හේතු නිසා තවදුරටත් කාලය අවශ්‍ය වන්නේ නම් නැවතත් විධිමත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

v. වෛද්‍ය වාර්තා සනාතන සභාව මගින් පිළිගැනීමකදී විභාග ගාස්තු නිදහස් කිරීමක් සිදුනොවන අතර, විභාගයට පෙනී සිටීමට ඇති එක් අවස්ථාවක් අහිමි වන බව සැලකිය යුතුය.

<u>සැලකිය යුතුයි:</u> *නියමිත විභාගයක් සඳහා වෛද්‍ය හේතුවක් නිසා පෙනී නොසිටන ශිෂ්‍යයකු එම කරුණ සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීමක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සනාතන සභාව සතු ය.*

විභාග සම්බන්ධව යම් දැනුවත් කිරීමක් අවශ්‍ය වේ නම් ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිලධාරීන් සම්බන්ධ කරගත හැකිය.

- සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
- සම්බන්ධීකාරක/ විභාග හා ලියාපදිංචි කිරීම්, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
- අධ්‍යක්ෂක/ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය